

වරලත් ගණකාධිකාරී
ඩබ්. ඒ. උපේන්ද්‍ර විජේසිංහ
(FCA,ACMA (UK), ACCA (UK), ACMA, BSC Accountancy)
0703357000
upendra@wjassociate.com

CA | SCHOOL OF ACCOUNTING & BUSINESS
THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සඳහා පෙරහුරු ප්‍රශ්න පත්‍රය

## ගිණුම්කරණය - II

උපදෙස් :

- පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 06කට පමණක් පිළිතුරු ලියන්න.

**ප්‍රශ්න අංක 01.**

සී/ස පූර්වී සමාගමේ පොත්වල 2018/03/31 දිනට උපුටා ගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | රු 000 | රු 000 |
|---|---|---|
| රු 10 සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 4 000 |
| පොදු සංචිතය | | 3 800 |
| ලාභාලාභ ගිණුම 2017/04/01 | | 2 260 |
| ඉඩම් හා ගොඩනැගිලි පිරිවැයට | 4 600 | |
| යන්ත්‍ර හා උපකරණ පිරිවැයට | 1 900 | |
| ලී බඩු හා සවිකිරීම් පිරිවැයට | 800 | |
| මෝටර් රථ පිරිවැයට | 1 600 | |
| ගැණුම් හා විකුණුම් | 5 175 | 11 500 |
| ණයගැතියෝ හා ණයහිමියෝ | 680 | 510 |
| 2017/04/01 තොගය | 400 | |
| 2016/2017 බදු ප්‍රතිපාදන | | 290 |
| 2017/2018 ගෙවූ බදු | 500 | |
| ගෙවූ VAT බදු | 500 | |
| අධ්‍යක්ෂ ගාස්තු | 350 | |
| විගණන ගාස්තු | 260 | |
| පරිපාලන වියදම් | 1 828 | |
| බෙදාහැරීමේ වියදම් | 600 | |
| 20% ණයකර | | 3 000 |
| ගෙවූ ලාභාංශ දළ - සාමාන්‍ය කොටස් | 610 | |
| ක්ෂය වෙන්කිරීම් (2017/04/01) - ගොඩනැගිලි | | 1 000 |
| යන්ත්‍ර හා උපකරණ | | 700 |
| ලී බඩු හා සවිකිරීම් | | 200 |
| මෝටර් රථ | | 500 |
| කෙටිකාලීන ආයෝජන | 3 700 | |
| මුදල් හා බැංකු | 4 257 | |
| | 27 760 | 27 760 |

**පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.**

1. පවත්වාගෙන යනු ලබන තොග වාර්තා පරීක්ෂා කිරීමෙන් ලබා ගන්නා ලද තොග පිරිවැය රු. 450,000කි. වර්ෂ අවසානයේ දී තොග සත්‍යාපනයේ දී පිරිවැය රු. 20,000ක් වූ තොග අයිතම සමහරක් සම්පූර්ණයෙන්ම හානියට පත් වී ඇති බව අනාවරණය වී ඇත. එයට අමතරව පිරිවැය රු. 15,000ක් වූ තොග අයිතම අර්ධ වශයෙන් හානියට පත් වී තිබුණි. මෙම අර්ධ වශයෙන් හානියට පත් අයිතම විකිණීම පිණිස තවත් රු. 2,500ක විකුණුම් වියදමක් දැරීමෙන් පසු ඒවා රු. 7,500කට අලෙවි කළ හැක.

2. 2017/2018 වර්ෂයේ ගෙවූ බදු තුළ 2016/2017 වසර සඳහා ගෙවූ රු. 300,000ක මුදල ඇතුළත් වේ. 2017/2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු බද්ද රු. 250,000කි.

3. ගැනුම් හා විකුණුම් තුළ 15% බැගින් වූ VAT බදු ඇතුළත් වේ. අදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවූ VAT බද්ද සටහන් කිරීම හැර වෙනත් ගැලපුමක් කර නැත.

4. පරිපාලන වියදම් තුළ පහත සඳහන් වියදම් ද ඇතුළත්ය.

| | |
|---|---|
| වැටුප් හා වේතන | 1 520 000 |
| අර්ථසාධක අරමුදල් වියදම් | 182 400 |
| සේවක භාරකාර අරමුදල් වියදම් | 45 600 |

2018 මාර්තු මස වේතනය රු. 240,000ක් 2018/03/31 දින වන විට උපචිතව පැවැති අතර, ඊට අදාළ 12% සේවක අර්ථසාධක අරමුදල් වියදම් ද, සේවක භාරකාර අරමුදල් වියදම් ද ගිණුම්ගත කර නොමැත.

5. අධ්‍යක්ෂ ගාස්තු රු. 100,000ක් හා විගණන ගාස්තු රු. 40,000ක් 2018 03 31 දිනට උපචිතය.

6. ඉඩමේ පිරිවැය රු. 1,600,000ක් විය.

7. සමාගම විසින් 2017 ජූලි 01 දින රු. 200,000 ක උපකරණ මිලට ගන්නා ලදී. සමාගම විසින් 2014 අප්‍රේල් මස රු. 600,000ක පිරිවැයට මිලදී ගනු ලැබූ මෝටර් වාහනයක් 2018/03/31 දින රු. 350,000කට විකුණන ලදී. වත්කම් මිලදී ගැනීම සඳහා ගෙවූ මුදල් වත්කම් ගිණුම හර කර ඇති අතර, විකිණීමෙන් ලද මුදල් වත්කම් ගිණුම බැර කර ඇත.

සරල මාර්ග ක්‍රමයට පහත සඳහන් අනුපාත යටතේ ක්ෂය ප්‍රතිපාදනය කෙරේ.

| | වාර්ෂිකව |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| යන්ත්‍ර හා උපකරණ | 20% |
| ලී බඩු හා සවිකිරීම් | 15% |
| මෝටර් රථ | 25% |

8. සාමාන්‍ය කොටස් සඳහා 20%ක අවසාන ලාභාංශයක් ගෙවීමට යෝජනා කර ඇත.

9. පොදු සංචිතයට රු. 100,000ක් මාරු කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය යෝජනා කර ඇත.

10. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම කොටස් 4:1 ප්‍රසාද වශයෙන් ලබාදීමට තීරණය කරන ලදී. මේ පිළිබඳ පොත්වල වාර්තා කර නොමැත.

අවශ්‍ය වන්නේ,

1) 2018/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ අදායම් ප්‍රකාශනය.
2) 2018/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.
3) 2018/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය.

(ලකුණු 20)

**ප්‍රශ්න අංක 03.**

ශානි විසින් විසිතුරු මල් අලෙවිසලක් පවත්වාගෙන යයි. 2018.01.01 දිනට එම ව්‍යාපාරයේ පහත ශේෂ දක්නට ලැබුණි.

| | |
|---|---|
| උපකරණ | 450 000 |
| ණයගැතියෝ | 175 000 |
| තොගය | 125 000 |
| මුදල් | 250 000 |
| බැංකු ණය | 400 000 |
| ණයහිමි | 100 000 |

| දිනය | විස්තරය |
|---|---|
| 01/01 | ශානි විසින් ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා ව්‍යාපාරයට රු. 100,000ක් මුදලින් ගෙන එන ලදී. |
| 01/03 | ශානි විසිතුරු මල් ප්‍රදර්ශනයක දී රු. 75,000ක් වටිනා මල් තොගයක් නැවත විකිණීම සඳහා මිලදී ගන්නා ලදී. |
| 01/05 | රු. 50,000ක පිරිවැය වූ මල් තොගයක් පිරිවැය මත 20%ක ලාභයක් සහිතව මල්ෂිට විකුණන ලදී. |
| 01/08 | මාසික කඩ කුලී වියදම වූ රු. 10,000 කඩ හිමිකරුට ගෙවන ලදී. |
| 01/12 | ශානි තම නැගණියගේ මංගල උත්සවය සඳහා රු. 20,000ක් වටිනා මල් තොගයක් රැගෙන යන ලදී. |
| 01/15 | මල්ෂි තම ණය මුදල පියවූ අතර ශානි විසින් ඒ සඳහා 5%ක වට්ටමක් ලබා දෙන ලදී. |
| 01/20 | දින කිහිපයක් අලෙවිසල විවෘත නොකිරීමට නොහැකි වූ හෙයින් රු. 5,000ක මල් තොගයක් භාවිතයට නොහැකි තත්ත්වයට පත්ව තිබුණි. |
| 01/27 | උපකරණ වාර්ෂික අනුපාතය 20%කින් ක්ෂය කරන ලදී. |
| 01/28 | බැංකු ණය වාරිකය ගෙව්වා රු. 20,000 යි. මෙහි ඇතුළත් පොළිය රු. 5,000කි. |

අවශ්‍ය වන්නේ,

1. පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණය යටතේ ආරම්භක ශේෂයන් සහ එක් එක් ගනුදෙනුවේ අගය පෙන්නුම් කරන්න.

උපකරණ + ණයගැති + තොග + මුදල් + ප්‍රාග්ධනය + බැංකු ණය + ණයහිමි

(ලකුණු 10)

2. 2018.01.31 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කරන්න.

(ලකුණු 02)

3. ශුද්ධ වත්කම් ප්‍රවේශය ඇසුරින් 2018 ජනවාරි 31 න් අවසන් මාසය සඳහා ශුද්ධ ලාභය ගණනය කරන්න.

(ලකුණු 03)

(ලකුණු 15)

**ප්‍රශ්න අංක 04.**

(අ) තාරුකාගේ ව්‍යාපාරයේ 2018.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 64,200ක් වූ අතර, ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 44,700ක් විය. පාලන ගිණුමේ හා ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එකතුව අතර අසමානතාවයට හේතු වූ කරුණු පහත දැක්වේ.

1. විකුණුම් ජර්නලය රු. 8,000ක් අඩුවෙන් එකතු කර ඇත.
2. විජිතගෙන් ලැබිය යුතු ශේෂය වූ රු. 10,000ක් බොල් ණය ලෙස කපා හැරීමට තීරණය කළ අතර, එය ණයගැති ලෙජරයේ නිවැරදිව පිටපත් කර ඇති අතර, පොදු ලෙජරයේ පිටපත් කර නැත.
3. රු. 7,500ක් වූ ණයගැති ශේෂයක් ශේෂ ලේඛනයෙන් මඟහැරී ඇත.
4. අසේලට කළ රු. 10,500ක විකුණුම් පොදු ලෙජරයේ සටහන් වූවත් ණයගැති ලෙජරයේ පිටපත් වී නැත.
5. රු. 6,900ක් වූ බැරපතක් සම්පූර්ණයෙන්ම පොත් වලින් මඟහැරී ඇත.
6. සුමේධට දුන් වට්ටම වූ රු. 7,500ක් ඔහුගේ ගිණුමේ පිටපත් වී නැත.
7. ණයගැති ලෙජරයේ රු. 7,000ක ණයගැතියෙකු ණයහිමි ලෙජරයට මාරු කිරීම පිළිබඳව පාලන ගිණුමේ සටහන් කර නැත.

අවශ්‍ය වන්නේ,

1. සංශෝධිත ණයගැති පාලන ගිණුම.
2. ණයගැති ශේෂ ලැයිස්තුව නිවැරදි කිරීමේ ප්‍රකාශනය.

(ලකුණු 05)

(ආ) මධූගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනට බැංකුව විසින් එවන ලද සාරාංශගත බැංකු ප්‍රකාශය පහත දී ඇත.

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| 12/01 දිනට ශේෂය | | | 39,000 |
| චෙක් තැන්පතු | | 102,000 | 141,000 |
| මුදල් තැන්පතු | | 62,000 | 203,000 |
| ගෙවූ චෙක්පත් | 42,000 | | 161,000 |
| ස්ථාවර තැන්පතු පොළී | | 16,800 | 177,800 |
| ණය පොළී | 16,000 | | 161,800 |
| බැංකු ගාස්තු | 8,800 | | 153,000 |

අතිරේක තොරතුරු,

1. 2017.12.01 දිනට ඉදිරිපත් නොවූ හා උපලබ්ධි නොවූ චෙක්පත්වල විස්තරය පහත පරිදි වේ.
   I. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් රු. 12,300කි. (මින් රු. 8,600ක් වටිනා චෙක්පත් දෙසැම්බර් මාසය තුළ උපලබ්ධි වී ඇත.)
   II. ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් රු. 12,700කි. (මින් රු. 7,100ක් වටිනා චෙක්පතක් දෙසැම්බර් මාසය තුළ නිෂ්කාශනය වී ඇත.)
   
   (ආරම්භක ශේෂ වෙනස් වීමට බලපාන හේතු වන්නේ ඉහත සඳහන් ගැළපිලි පමණක් බව උපකල්පනය කරන්න.)

2. 2017.12.31 දිනට ඉදිරිපත් නොවූ හා උපලබ්ධි නොවූ චෙක්පත්වල සාරාංශය පහත පරිදි වේ.
   I. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් රු. 13,200
   II. නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් රු. 14,900

3. ස්ථාවර තැන්පතු පොළී, ණය පොළී සහ බැංකු ගාස්තු කිසිවක් දෙසැම්බර් 31 වන විටත් ලෙජරයට ඇතුළත් වී නොතිබිණි.

අවශ්‍ය වන්නේ,

1. 2017.12.01 දිනට ලෙජරයේ ඇති බැංකු ගිණුමේ ශේෂය.
2. 2017 දෙසැම්බර් මාසයේ ලෙජරයේ ඇති බැංකු ගිණුම අනුව,
   I. නිකුත් කළ මුළු චෙක්පත්වල වටිනාකම.
   II. තැන්පත් කළ මුළු චෙක්පත්වල වටිනාකම.
3. 2017 දෙසැම්බර් මාසය සඳහා සංශෝධනය කිරීමට පෙර බැංකු ගිණුමේ ශේෂය.
4. සංශෝධිත බැංකු ගිණුම.
5. 2017.12.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය.

(ලකුණු 10)

**(මෙම ප්‍රශ්න පත්‍රයට අදාල පිළිතුරු ජුනි 03 ඉරිදා ලක්බිම කලාපයේත් පලවන අතර Facebook.com/sabcasl ෆේස්බුක් පිටුවෙහිත් පල වේ.)**

**උසස් පෙළින් පසු ලොවම පිළිගත් ව්‍යවහාරික ගණකාධිරණ උපාධිධාරියෙකු වන්න.**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ජාතියේ දරුවන්ගේ උපාධි සිහිනය මල්ඵල ගන්වමින් ව්‍යාවහාරික ගණකාධිකරණය පිළිබඳ සාමාන්‍ය සහ විශේෂ උපාධි පාඨමාලාවන් හඳුන්වා දී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පූර්ණ අනුමැතිය සහිත මෙම උපාධි පාඨමාලාවන් ඔබට ඉතා සාධාරණ ගාස්තු ව්‍යුහයක් යටතේ හැදෑරිය හැක.

අධ්‍යාපනය පමණක් නොව ඔබට මේ සමඟ ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ සමාගම් වල ප්‍රායෝගික පුහුණු අවස්ථාවන් ද ලැබෙනු ඇත. මෙම උපාධි පාඨමාලාවේ දේශන මෙහෙයවීම සඳහා ඉහළම සුදුසුකම් සපුරන ලද ප්‍රධාන පෙළේ දේශකවරුන් පමණක් සහභාගී වන බැවින් ඉතා ඉහළ ගුණාත්මකභාවයක් රැඳී පවතිනු ඇත.

සම්පූර්ණ විශ්වවිද්‍යාල පරිසරයක ඔබ අත්විඳීමට බලාපොරොත්තු වන විෂය හා විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ද ඔබට මෙහි දී අවස්ථාව ලැබේ.

ඔබට 2018 උසස් පෙළ විභාගය නිම කළ වහාම ප්‍රතිඵල අපේක්ෂාවෙන් මෙම පාඨමාලාව සඳහා 2018 සැප්තැම්බර් මස දී සම්බන්ධ විය හැකිය.

විස්තර සඳහා අමතන්න : 011 - 2 352 077 / 071 0 235 263

ප්‍රශ්න අංක 2, 5, 6, 7, ජුනි 24 කලාපයේ පළකරන බව කරුණාවෙන් සලකන්න